මේ වනාහී මෙතෙක් මෙරට ක්‍රියාත්මක කරන ලද ප්‍රබලතම ආර්ථික ප්‍රතිසංස්කරණයන් කිහිපයකි. ජන සංඛ්‍යා වර්ධනය සීමා කිරීමෙන්, ආදයම් වඩාත් සමසේ බෙදීයාමට සැලැස්වීමෙන් සහ වැඩි ඒක පුද්ගල ආදයම් සහිත වෙනත් බොහෝ රටවල දක්නට නොමැති අන්දමේ ජීවන තත්ත්වයන් පවත්වාගෙන යාමෙන් අතීතයේදී ශ්‍රී ලංකාව සාර්ථක ප්‍රතිඵල ලබා ඇතිවාට කිසිදු සැකයක් නොමැත. මෙකී සමාජයීය ජයග්‍රහනයන් තිබියදීත්, ආර්ථිකයේ අල්ප දියුණුව හේතුකොටගෙන එකී ජීවන තත්ත්වයන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව දැඩි අන්දමින් හීන වී ඇත. මෙම ප්‍රශ්නයට තුඩු දුන් ප්‍රධාන හේතූන් මෙසේ රජය නිශ්චය කළේය. පාරිභෝජනය සඳහා දිගින් දිගටම සම්පත් විශාල ප්‍රමාණයක් වෙන් කිරීම ආර්ථික සංවර්ධනයට හා රැකීරක්‍ෂා ජනිත කිරීමට අහිතකර විය; වර්ෂ ගණනාවක් තිස්සේ වැඩෙමින් පැවති දැඩි පාලන තන්ත්‍රය මෙරට සාපේක්‍ෂ මිළ ගණන් තියුණු අන්දමින් විකෘති කොට පෞද්ගලික අංශය අධෛර්යමත් කොට තිබිණි; මෙම අඩුපාඩුව සපුරාලන අටියෙන් ගොඩනංවන ලද රාජ්‍ය අංශය නාස්තිකාර හා අලස බවට පත්වී තිබුණි; පිළිවෙලින් පැමිණි රජයයන්ට මේවා නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි විය; ඒ වෙනුවට කෙටි කාලීන තාවකාලික පිළියම් යෙදීම නිසා ප්‍රශ්න තව තවත් උග්‍ර විය. මේ ආකාර ආර්ථික විනිශ්චයක් තුලින් නව ආර්ථික ප්‍රතිපත්තිය බිහිවී ඇත. මේ අනුව නිගමනය වනුයේ රටේ සම්පත් වලින් වැඩි කොටසක් ආදයම් සහ රැකියා වඩන ආයෝජනය කෙරෙහි යෙදවිය යුතු බවයි; රුපියලේ අගය අස්වාභාවික ලෙස වැඩියෙන් පවත්වාගෙන යාමේ මූලික චේතනාවෙන් ඇරඹුනු විදේශීය වෙළඳම සහ ගනුදෙනු පාලනය ඉවත් කළයුතු බවයි; පෞද්ගලික අංශය අධෛර්යමත් කිරීම අහෝසි කළයුතු බවයි; රාජ්‍ය අංශය වඩාත් කාර්යක්‍ෂම කළයුතු බවයි; එකී මූලික ප්‍රතිපත්ති මාලාවෙහි ප්‍රාථමික අරමුණ වූයේ, ආයෝජනය සඳහා වඩා වැඩියෙන් සම්පත් යෙදවීමත්, දරදඬු පාලනයන්ගෙන් ආර්ථිකය මුදවා ගැනීමෙන් ආර්ථික ව්‍යුහයෙහි සම්පත් ආයෝජනය හෙවත් යෙදවීම වෙළඳපලේ න්‍යායයන් අනුව සිදුවීමට අවකාශ ලබාදීමත්ය.

මෙම ප්‍රතිපත්තින්හි සාර්ථකත්වය විශේෂයෙන් රඳා පවතිනුයේ, සමාජයීය හා දේශපාලනමය අවහිරතාවන් අභිබවා, එම ප්‍රතිපත්තීන් යථාර්ථ අවසානය දක්වා ක්‍රියාත්මක කරවන්නා වූ ආකාරය හා බලාපොරොත්තු වන නිෂ්පාදන ආදයම් හා රැකීරක්‍ෂා වැඩීම සඵල වන වේගය මතය. කෙටිකාලීන වශයෙන් සලකන කල්හි, විශේෂයෙන්ම සැලකියයුතු විදේශීය සම්පත් පරතරයක් ඇතිවුවහොත්, මිනිසුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම සමහන් කිරීම පිණිස විදේශාධාර ලබාගැනීමට සිදුවනවා ඇත. එසේම, ආර්ථිකය නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය නියම අන්දමින් ක්‍රියාත්මක වීමට කාලයක් ගතවනු ඇත. උදාහරණයක් වශයෙන්, එකී නිදහස් කිරීමට අනනුරූව ආනයනයන්හි තරමක උදාසීන භාවයක් දක්නට ලැබේ. එහෙත්, දිගු කාලයක් තිස්සේ තිබූ දැඩි පාලනය හේතුකොටගෙන, සිය වෙළඳ සබඳකම් නැවත පිහිටුවා ගැනීමටත්, වෙළෙඳපොල ගැන සොයා බැලීමටත්, ආනයන කරුවනට සිදුවන බැවින්, එවැන්නක් සිදුවීම බලාපොරොත්තු විය යුත්තකි. එපමණක් නොව, දැඩි පාලන තන්ත්‍රය ලිහිල් කිරීමද ක්‍රමානුකූලව කළයුතුය. රජය විසින් මෑතකදී ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණයන් බලාපොරොත්තු වන යථාර්ථ අවසානය දක්වා ගෙනයාමට නම්, මෙකී නව ආර්ථික ප්‍රතිපත්තීන්හි ගැබ්වූ මූලික දර්ශනය කවරක්දැයි ඒවා ක්‍රියාත්මක කරන්නවුන් විසින් අවබෝධ කළයුතු බව වැදගත් කාරණයකි. එමගින් අනාගතයේදී ක්‍රියාත්මක කෙරෙන නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන්හි අන්‍යෝන්‍ය එකඟත්වය තහවුරු වනවා ඇත.

## ජාතික නිෂ්පාදිතය සහ ආදයම

වර්තන මිල ගණන් අනුව 1977 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශ ලක්ෂ 29,122 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය 1976 වර්ෂය සමග සැසඳීමේදී සියයට 20.9 ක වැඩිවීමකි. මිල වැඩිවීම්වලට ගැලපූ පසු, 1959 ස්ථාවර මිල ගණන් අනුව 1977 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය, 1976 වර්ෂයේ වාර්තාගත සියයට 3.0 ක වර්ධනය හා සසඳන කල, සියයට 4.4 කින් වර්ධනය වී ඇත. 1977 වර්ෂයේ ආර්ථිකයේ ඉහල වර්ධන අනුපාතය මූලික වශයෙන් දේශීය කෘෂිකාර්මික නිමැවුමේ සහ සේවා අංශයේ වැඩිවීම් නිසා උද්ගත වූවකි.

තාවකාලික ඇස්තමේන්තු අනුව 1977 වර්ෂයේ මැදි වසර ජනගහණය සියයට 1.76 කින් වර්ධනය වී, දශ ලක්ෂ 13.97 දක්වා වැඩි වී ඇත. ඒ අනුව ඒක පුද්ගල මූර්ත දළ ජාතික නිපැයුම රුපියල් 855 ක් විය. මෙය 1976 වර්ෂයේ සියයට 1.3 ක වැඩිවීම හා සසඳා බලන විට සියයට 2.6 ක වැඩිවීමකි.

නිර්යාත මිල ගණන් වල නොකඩවා පැවති වර්ධනයේ මූලික ප්‍රතිඵලයක් වශයෙන් 1976 දී සියයට 35 කින් වර්ධනය වූ වෙළඳ අනුපාතය[1] 1977 වර්ෂයේ දී තව දුරටත් සියයට 31 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මූර්ත ජාතික ආදයම[2] සියයට 9.1 කින්, නැතිනම් 1976 වර්ෂයේ මූර්ත ජාතික ආදයමේ වර්ධනයට වඩා ඉහල සියයට ගණනකින් වැඩි විය. ඒක පුද්ගල මූර්ත ආදයම සියයට 7·3 කින් ඉහල නැගුණි. පසුගිය වර්ෂ 10 ට අදාල දත්ත, පළමුවැනි සංඛ්‍යා සටහනෙහි සාරාංශ කර දක්වා ඇත.

**ආංශයික වර්ධනය**

1959 පාද වර්ෂය වශයෙන් සලකා 1959 ස්ථාවර සාධක මිල ගණන් අනුව, පසුගිය වර්ෂ පහ තුල දළ ජාතික නිෂ්පාදිතයේ ආංශයික වර්ගීකරණය දෙවැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ. එයින් පෙන්නුම් කරන පරිදි, 1977 වර්ෂයේදී සියයට 4·4 ක වර්ධනයට, විශාල වශයෙන් හේතුවූයේ සියයට 7.2 කින් කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය ඉහල යාම සහ සියයට 6.9 කින් සේවා අංශයේ සිදුවූ වර්ධනයත්ය. පතල් කර්මාන්තයේ සහ ඉදිකිරීම් කටයුතුවල පහල යාමක් පෙන්නුම් කළ අතර අනිත් අංශවල සුළු වර්ධනයක් පෙන්නුම් කළේය.

1976 වර්ෂයේදී, කෘෂිකර්මය, වන ද්‍රව්‍ය සහ ධීවර යන අංශවල නිමැවුම සියයට 1 කින් පහත වැටුනද, 1977 දී මෙම අංශයන්හි වර්ධනයක් පෙන්නුම් කරයි. මෙයට මූලික වශයෙන් හේතුවූයේ 1976 වර්ෂයේදී සියයට 4 ක වර්ධනයක් පෙන්නුම් කළ දේශීය කෘෂිකාර්මික අංශය, 1977 වර්ෂයේදී සියයට 10 කින් වර්ධනය වීමය. 1977 වර්ෂයේදී වී නිෂ්පාදනය සියයට 34 කින් ඉහල ගොස් ඇති අතර, අතිරේක බෝගවර්ග පලතුරු සහ එලවළු නිෂ්පාදනය සියයට 5 කින් වැඩිවී ඇත. අනිත් අතට, වතු කෘෂිකාර්මික අංශය සියයට 0·4 කින් පමණක් සුළු වශයෙන් වර්ධනය වූයේ තේ නිෂ්පාදනයේ සියයට 6 ක වර්ධනයක්ද, රබර් හා පොල් නිෂ්පාදනයන්හි පිළිවෙලින් සියයට 0·7 ක සහ සියයට 9·2 ක පහත වැටීමක් ද නිසාය. දේශීය කෘෂිකර්මයේ සහ තේ නිෂ්පාදනයේ වර්ධනයට ප්‍රධානතම සාධකය වූයේ සතුටුදයක කාලගුණ තත්ත්වයයි. පසුගිය අවුරුද්දේ පැවති නියඟය, 1977 වර්ෂයේ පොල් නිෂ්පාදනය කෙරෙහි අයහපත් අන්දමින් බලපෑවේය.

1975 වර්ෂයේදී සියයට 30 කින් ද, (1974 දී පසුබෑමකින් පසුව) 1976 සියයට 43 කින්ද වර්ධනය වූ පතල් සහ කැනීම් කටයුතු, 1977 වර්ෂයේදී පහත වැටීමක් පෙන්නුම් කරයි. මෙය මැණික් අපනයනයේ සහ ඉදිකිරීම් කටයුතුවල පහත වැටීම නිසා සිදුවූවකි.

1975 දී සහ 1976 දී පිළිවෙලින් සියයට 8 ක් සහ සියයට 2 ක වර්ධනයක් පෙන්නුම් කළ නිෂ්පාදන අංශය (තේ, රබර්, පොල් සහ වී සකස් කිරීමද ඇතුලත්ව) 1977 වර්ෂයේ දී සියයට 1 කින් වර්ධනය වීමෙන් වර්ධනයේ පහත වැටීමක් පෙන්නුම් කළේය. කර්මාන්ත ශාලා නිෂ්පාදන අංශයේ නිමැවුම සියයට 2 කින් වර්ධනය වූ අතර (1976 වර්ෂයේ සියයට 5 ක වර්ධනය හා සසඳා බලන කල), ගෘහ කර්මාන්ත අංශය ද (මූලික වශයෙන් රෙදිපිළි) සියයට 2 කින් (1976 සියයට 8 වර්ධනය හා සසඳා බලන විට) වර්ධනය විය. එසේ වුවද තේ, රබර් සහ පොල් සැකසුම්වල එකතු කළ මූර්ත වටිනාකම සියයට 0.6 කින් පහතවැටුනේ පොල් සහ රබර් නිෂ්පාදනයේ පහල වැටීම නිසාය. 1976 දී මෙම අංශයේ නිෂ්පාදනයේ සියයට 6 ක විශාල පහත වැටීමක් පෙන්නුම් කළේය.

---

1. වෙළඳ අනුපාතය $\frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$

ලෙස ගණනය කෙරේ. විදේශ වෙළඳම ආර්ථිකයෙහි විශේෂ ස්ථානයක් හිමිකර ගන්නා නිසා, වෙළඳ අනුපාතයෙහි සිදුවන වෙනස්කම් මූර්ත ජාතික ආදයම කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇතිකරයි. වෙළඳ අනුපාතයෙහි වර්ධනයක් සිදු වුවහොත්, කිසියම් අපනයන ප්‍රමාණයකින් ලබාගත හැකි ආනයන ප්‍රමාණයෙහි වැඩිවීමක් සිදුවන අතර, එමගින් නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවල හුවමාරු වටිනාකමද ඉහල යයි.

2. වෙළඳ අනුපාතයෙහි වෙනස්වීම් අනුව මූර්ත දළ ජාතික නිපැයුම ගැලපීමෙන්, මූර්ත ජාතික ආදයම ගණනය කරනු ලැබේ.

## 1 වැනි සංඛ්‍යා සටහන

## ජාතික නිෂ්පාදිතය, ආදායම හා ජනගහණය – 1968–77

| වර්ෂය | | පවත්නා මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය | | ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය | | මූර්ත ජාතික ආදායම | | මැදි වසර ජනගහණය | | ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (ස්ථාවර මිල අනුව) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. දශලක්ෂ | වර්ධන වේගය | රු. දශලක්ෂ | වර්ධන වේගය | රු. දශලක්ෂ | වර්ධන වේගය | දහස් | වර්ධන වේගය | රුපියල් | වර්ධන වේගය |
| 1968 | .. | 9,876 | 19·5 | 8,901 | 8·4 | 8,117 | 7·6 | 11,992 | 2·5 | 742 | 5·7 |
| 1969 | .. | 10,725 | 8·6 | 9,301 | 4·5 | 8,487 | 4·6 | 12,252 | 2·2 | 759 | 2 3 |
| 1970 | .. | 11,562 | 7·8 | 9,686 | 4·1 | 8,771 | 3·3 | 12,514 | 2·1 | 774 | 2·0 |
| 1971 | .. | 11,786 | 1·9 | 9,725 | 0·4 | 8,770 | 0·0 | 12,699 | 1·5 | 766 | – 1·0 |
| 1972 | .. | 12,616 | 7·0 | 10,038 | 3·2 | 9,068 | 3·4 | 12,951 | 2·0 | 775 | 1·2 |
| 1973 | .. | 15,168 | 20·2 | 10,419 | 3·8 | 9,248 | 2·0 | 13,091 | 1·1 | 796 | 2·7 |
| 1974 | .. | 19,738 | 30·1 | 10,815 | 3·8 | 9,671 | 4·6 | 13,284 | 1·5 | 814 | 2·3 |
| 1975* | .. | 21,946 | 11·2 | 11,115 | 2 8 | 9,746 | 0·8 | 13,514 | 1·7 | 822 | 1 0 |
| 1976* | .. | 24,088 | 9·8 | 11,443 | 3·0 | 10,137 | 4·0 | 13,730 | 1·6 | 833 | 1·3 |
| 1977* | .. | 29,122 | 20·9 | 11,952 | 4·4 | 11,062 | 9 1 | 13,971 | 1·7 | 855 | 2·6 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 2 වැනි සංඛ්‍යා සටහන

### ස්ථාවර ( 1959 ) සාධක පිරිවැය මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි ආංශික සැකැස්ම

(රු. දශලක්ෂ)

| අංශ | 1959 | | 1973 | | 1974 | | 1975* | | 1976* | | 1977* | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය දඩයම සහ ධීවර කර්මාන්තය .. | 2,302 | 39·1 | 3,420 | 32·8 | 3,582 | 33·1 | 3,602 | 32·4 | 3,568 | 31·2 | 3,828 | 32·0 |
| 2. පතල් හා කැනීම් .. | 31 | 0·5 | 266 | 2·5 | 191 | 1·8 | 248 | 2·2 | 354 | 3·1 | 311 | 2·6 |
| 3. නිපැයුම් කර්මාන්තය .. | 682 | 11·6 | 1,421 | 13·6 | 1,420 | 13·1 | 1,462 | 13·2 | 1,489 | 13·0 | 1,505 | 12·6 |
| 4. තැනීම් කටයුතු .. | 283 | 4·8 | 516 | 5·0 | 553 | 5·1 | 503 | 4·5 | 531 | 4·6 | 480 | 4·0 |
| 5. විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | 9 | 0·1 | 31 | 0·3 | 31 | 0·3 | 33 | 0·3 | 36 | 0·3 | 37 | 0·3 |
| 6. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ .. | 541 | 9·2 | 1,019 | 9·8 | 1,054 | 9·8 | 1,100 | 9·9 | 1,144 | 10·0 | 1,198 | 10·0 |
| 7 තොග හා සිල්ලර වෙළඳාම .. | 801 | 13·6 | 1,383 | 13·3 | 1,450 | 13·4 | 1,501 | 13·5 | 1,545 | 13·5 | 1,623 | 13·6 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල .. | 51 | 0·9 | 142 | 1·4 | 165 | 1·5 | 184 | 1·7 | 191 | 1·7 | 229 | 1·9 |
| 9. නිවාස අයිතිය .. | 201 | 3·4 | 318 | 3·1 | 344 | 3·2 | 350 | 3·1 | 353 | 3·1 | 360 | 3·0 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව .. | 301 | 5·1 | 567 | 5·4 | 609 | 5·6 | 646 | 5·8 | 676 | 5·9 | 703 | 5·9 |
| 11. සේවා .. | 728 | 12·3 | 1,379 | 13·2 | 1,441 | 13·3 | 1,513 | 13·6 | 1,593 | 13·9 | 1,703 | 14·3 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. | 5,930 | — | 10,462 | — | 10,840 | — | 11,142 | — | 11,480 | — | 11,977 | — |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | – 37 | – 0·6 | – 44 | – 0·4 | – 25 | – 0·2 | – 27 | – 0·2 | – 37 | – 0·3 | – 25 | – 0·2 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 5,893 | 100·0 | 10,419 | 100·0 | 10,815 | 100·0 | 11,115 | 100·0 | 11,443 | 100·0 | 11,952 | 100·0 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ගොඩනැගිලි ද්‍රව්‍ය, විශේෂයෙන්ම සිමෙන්ති ප්‍රමාණවත් පරිදි ලබාගැනීමට නොහැකි වීම, සහ ඒවායේ මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉදිකිරීම් අංශයේ කටයුතු පහත මට්ටමක පැවැත්තේය. 1976 වර්ෂයේ සියයට 6 ක වර්ධනය හා සසඳා බලන විට, 1977 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු වල එකතු කළ වටිනාකම සියයට 10 කින් පහත වැටී ඇත. එසේ වුවද, පාරවල්, පාලම් සහ වාරිමාර්ග ඉදිකිරීම් වැනි රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කටයුතු වල සියයට 29 ක වර්ධනයක් පෙන්නුම් කළේය. මේ අනුව ඉදිකිරීම් අංශයේ පහල යාමක් ඇතිවූයේ, පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතුවල පසුබෑම නිසාය.

1976 වර්ෂයේ සියයට 4 ක වර්ධනය හා සසඳා බලන විට, 1977 වර්ෂයේ දී සේවා අංශයේ නිමැවුම සියයට 6 කින් වැඩිවූ බව ගණන් බලා තිබේ. 1976 වර්ෂයේ දී පිළිවෙලින් සියයට 3 ක සහ සියයට 4 ක වර්ධනයක් පෙන්නුම් කළ වෙළඳ සහ ප්‍රවාහන අංශයන් හි 1977 වර්ෂයේ වර්ධනය සියයට 6 කි. දේශීය කෘෂිකර්මාන්තයේ සහ නිෂ්පාදන කර්මාන්තවල වර්ධනයේ බලපෑම මෙයට හේතුවිය. බැංකු සහ මූල්‍ය අංශයන්හි ද මෙවැනි වර්ධනයක් දැකිය හැක.

දළ දේශීය නිෂ්පාදිතයේ අංශයිය සැකැස්ම තව දුරටත් පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ දළ දේශීය නිෂ්පාදිතය තුල කෘෂිකාර්මික අංශයේ ඇති අඛණ්ඩ වැදගත් කමයි. 1960 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 37 ක්ව පැවැති කෘෂි අංශයේ ප්‍රමාණයේ සුළු අඩුවීමක් දක්නට ලැබුණද පසුගිය අවුරුදු 5 තුල මෙම අංශය දළ ජාතික නිෂ්පාදිතයේ 1/3 කට දයක වී ඇත.

දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා යොදගනු ලැබූ දැඩි ආරක්ෂණ සහ පාලිත ආනයන ආදේශන කර්මාන්ත ප්‍රතිපත්තියේ නිසරු බව පෙන්නුම් කරමින් 1960 වර්ෂයේ දී සියයට 12 ක් වූ කර්මාන්ත නිෂ්පාදන අංශයේ ප්‍රමාණය පසුගිය අවුරුදු පහ තුල සියයට 13 දක්වා වර්ධනය වී ඇත්තේ සුළු ප්‍රමාණයකින් පමණි. පතල් සහ කැනීම්, බැංකු සහ මූල්‍ය අංශයන් අතුරින්, විශේෂයෙන්ම පතල් සහ කැනීම් කටයුතු වල ගතික වර්ධනයක ලකුණු පෙන්නුම් කළද, සමස්ථ වශයෙන් ගත්කල දළ ජාතික නිෂ්පාදනයට එම අංශයන් ගෙන් කෙරෙන දයකත්වය තවමත් අල්ප වේ.

**සම්පත් සහ සම්පත් උපයෝජනය**

ආර්ථිකයේ මුළු සම්පත් ප්‍රමාණය සහ ඒවායේ උපයෝජනය 3 වන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

**3 වැනි සංඛ්‍යා සටහන**

**සම්පත් සංයුතිය සහ උපයෝගිකරගත් ආකාරය.**

| | 1976 | | 1977 | | කලින් වසරටවඩා වෙනස සියයට | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | සියයට ගණන | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | සියයට ගණන | 1976 | 1977 |
| 1· මුළු සම්පත් .. | 32,119 | 100·0 | 37,712 | 100·0 | 8·2 | 17·4 |
| 1·1 ද.දේ.නි. (වෙළඳ මිල අනුව) .. | 26,375 | 82·1 | 31,204 | 82·7 | 9·6 | 18·3 |
| 1·2 භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයන .. | 5,744 | 17·9 | 6,508 | 17·3 | 2·0 | 13·3 |
| 2· උපයෝගිකරණය .. | 32,119 | 100·0 | 37,712 | 100·0 | 8·2 | 17·4 |
| 2·1 පරිභෝජනය .. | 22,608 | 70.4 | 25,158 | 66·7 | 5·9 | 11·3 |
| 2·2 දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 4,595 | 14·3 | 5,035 | 13·4 | 24·2 | 9·6 |
| (අ) රජය .. | 1,631 | 5·1 | 1,542 | 4·1 | 48·9 | − 5·5 |
| (ආ) රජයේ සංයුක්ත මණ්ඩල .. | 588 | 1·8 | 861 | 2·3 | 38 0 | 46 4 |
| (ඇ) පෞද්ගලික අංශය .. | 2,376 | 7·4 | 2,632 | 7·0 | 9·1 | 10·8 |
| 2·3 භාණ්ඩ තොග . | − 40·1 | − 1·2 | + 159 | +0·4 | — | — |
| 3· භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 5,317 | 16·5 | 7,360 | 19·5 | 20·1 | 38·4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ දේශීය නිෂ්පාදිතයෙන් සහ ආයාත වලින් සමන්විත, 1977 වර්ෂයෙහි ආර්ථිකයෙහි වූ මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 37,712 ක් විය. 1976 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 32,119 ක් වූ මුළු සම්පත් ප්‍රමාණය හා සසඳන විට මෙය සියයට 17 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. දේශීය නිෂ්පාදනයෙන් ලබාගත හැකි සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,829 කින්ද, ආයාත වලින් ලබාගත හැකි සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 764 කින්ද වැඩිවී ඇත. 1976 වර්ෂයෙහි මුළු සම්පත් වලින් සියයට 18 ක්ව පැවැති ආයාත ප්‍රමාණය, 1977 වර්ෂයේදී සියයට 17 දක්වා පහත වැටී ඇත.

1977 වර්ෂයේ දී මුළු සම්පත් වලින් පරිභෝජනය සඳහා වෙන්කළ කොටස පහත වැටුන අතර, ආයෝජනය සහ නිර්යාත සඳහා වූ කොටස ඉහල ගියේය. ඒ අනුව 1976 දී පාරිභෝජන ප්‍රමාණය සියයට 70 ක් වූ අතර, 1977 වර්ෂයේදී එය සියයට 67 දක්වා අඩුවිය. මෙම කාලය තුලම, මුළු සම්පත් ප්‍රමාණයෙහි ප්‍රාග්ධන සම්පාදනය සියයට 13 සිට සියයට 14 දක්වාද අපනයන සියයට 17 සිට 20 දක්වා ද වැඩිවිය.

දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයට තොගවල වෙනස්කම් එකතු කිරීමෙන් ගණනය කරනු ලබන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1977 වර්ෂයේ දී සියයට 24 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වුවද, දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වැඩිවූයේ සියයට 10 කින් පමණි. මෙයට මූලික හේතුව රාජ්‍ය අංශයේ සියයට 5 කින් අඩුවූ ප්‍රාග්ධන සම්පාදනය අභිබවමින් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවන්හි ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ සැළකිය යුතු වර්ධනයයි.

පහත දැක්වෙන 4 වැනි සංඛ්‍යා සටහනෙහි ඇස්තමේන්තු කරන ලද දේශීය ඉතිරි කිරීම් දක්වා ඇත.

4 වැනි සංඛ්‍යා සටහන

**දේශීය ඉතුරුම්**

(රුපියල් දශලක්ෂ)

| | 1973 | 1974 | 1975* | 1976* | 1977* |
|---|---|---|---|---|---|
| 1. වෙළෙඳ මිල අනුව ද. දේ. නි. .. | 16,741 | 21,581 | 24,063 | 26,375 | 31,204 |
| 2. විදේශීය සම්පත් (භාණ්ඩ හා සාධක නොවන අපනයන) | 135 | 1,040 | 1,203 | 427 | − 852 |
| 3. ආයෝජන .. | 2,629 | 3,139 | 3,909 | 4,193 | 5,194 |
| 4. දේශීය ඉතුරුම් (3 − 2) . | 2,494 | 2,099 | 2,706 | 3,766 | 6,046 |
| 5. ඉතිරිකිරීම් අනුපාතය (4, එකෙහි ප්‍රතිශතයක් වශයෙන්) .. | 14·9 | 9·7 | 11·2 | 14·3 | 19·4 |

* තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහි දැක්වෙන පරිදි 1974 සිට නොකඩවාම දේශීය ඉතිරි කිරීම් සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය වැඩි වී ඇත. 1976 දී සියයට 14 ක් වූ ඉතිරි කිරීම් අනුපාතය 1977 දී සියයට 19 ක් විය.